ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1865/39 – 2014 ජුනි 06 වැනි සිකුරාදා – 2014.06.06

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/18/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එන්. ගුණසේකර මයා, අංක 80/1 ඒ, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ෂෝ වොලස් සිලෝන් ලිමිටඩ්, අංක 69, ශ්‍රී ජිනරතන පාර, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි, පී නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 මැයි මස 12 වැනි දින,
කොළඹ දී ය.

1A – G 19680 – 25 (2014/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/10/18/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එන්. ගුණසේකර මයා, අංක 80/1 ඒ, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ෂෝ වොලස් සිලෝන් ලිමිටඩ්, අංක 69, ශ්‍රී ජිනරතන පාර, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

1. ෂෝ වොලස් සිලෝන් ලිමිටඩ් ප්‍රධාන විධායක නිලධාරි ලෙස සේවය කළ එම්. එන්. ගුණසේකර මහතාගේ සේවය 2012.06.30 දින සිට අවසන් කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවූයේද යන්න සහ එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව

   සහ

2. 2012 මැයි මස වාර්ෂික ප්‍රසාද දීමනා සහ 2011/2012 වර්ෂය සඳහා ප්‍රයෝජනයට නොගත් නිවාඩු වෙනුවෙන් කරනු ලබන ගෙවීම් ලැබීමට එම්. එන්. ගුණසේකර මහතාට හිමිකම් තිබේද යන්න සහ එසේ හිමිකම් තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව

   සහ

3. එම්. එන්. ගුණසේකර මහතා විසින් රාජකාරි කටයුතුවලදී සමාගම වෙනුවෙන් දරන ලද වියදම්, ප්‍රවාහන වියදම්, සංග්‍රහ වියදම්, නිවාස නඩත්තු වියදම් සහ වෛද්‍ය සේවා වියදම් ප්‍රතිපූර්ණය නොකිරීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේද යන්න සහ එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 620

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.